ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No. }

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2022 - 12 - 21

පැමිණිලි පාර්ශවය : ගයාන් හර්ෂජිත් මයා,
නිකවැව හන්දිය,
නොච්චියාගම.

වගඋත්තර පාර්ශවය : පොලිස් කොස්තාපල් 47894 එස්.ඩී.අමිල බණ්ඩාර දිසානායක මයා,
පොලිස් ස්ථානය,
නොච්චියාගම.

පැමිණිලි අංකය : HRC/AP/269/2017(I)

පැමිණිල්ල :-

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් දන්වා ඇත්තේ, 2017.06.07 වන දින සවස 6.30 ට පමණ නොච්චියාගම නගරයේ තම හිතවතෙකුගේ වෙළෙඳසැළක් ඉදිරිපිට යහළුවෙකු සමඟ කතා කරමින් සිටියදී නොච්චියාගම පොලීසියේ රථවාහන අංශයේ අංක 47894 දරණ අමිල නැමැති පොලිස් නිලධාරියා එක් වරම පැමිණ තමාගේ කණට ගසා පරුෂ වචනයෙන් බැණවදින ලද බවයි.

එම අවස්ථාවේදී තමාට පහර දුන්නේ කුමකටදැයි ඇසූ විට නැවත නැවතත් පොලිස් නිලධාරියා තමාට බැණ වදිමින් තම කමිස කොලරයෙන් අල්ලා පහරදෙන්නට උත්සාහ කළ බවත්, පසුව තමාව අත්අඩංගුවට ගෙන පොලීසිය වෙත රැගෙන ගොස් පොලිස් සිර මැදිරියේ රඳවා තබා 2017.06.08 වන දින පෙ.ව .7.30 ට පමණ ඇප ලබාදුන් බවත් සඳහන් කර ඇත.

තමාට සිදුකළ පහරදීම සම්බන්ධයෙන් නොච්චියාගම රෝහලෙන් සහ අනුරාධපුර ශික්ෂණ රෝහලෙන් ප්‍රතිකාර ලබා ගත් බවද පැමිණිල්ලෙන් වැඩිදුරටත් දන්වා ඇත.

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office } 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R.A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson } 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax } 011-2505541/ 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail } sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone } 94 -11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary } 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline } 1996
වෙබ් / இணையம் / Web } www.hrcsl.lk

**වගඋත්තරකරුගේ ප්‍රකාශය :-**

නොච්චියාගම පොලිස් ස්ථානයේ ස්ථානාධිපති විසින් කොමිෂන් සභාව වෙත වාර්තාවක් යොමු කරමින් දන්වා ඇත්තේ, ගයාන් හර්ෂජිත් ජයවර්ධන යන අය 2017.06.07 වන දින නොච්චියාගම නගරයේ බස් නැවතුම්පළ ඉදිරිපිට බීමත්ව කලහකාරී ලෙස පරුෂ වචන කියමින් හැසිරෙමින් සිටිය දී මෙදින පැය 18.30 ට වරද කියා දී අත්අඩංගුවට ගෙන ඇති බවය.

**පොලිස් කොස්තාපල් 47894 අමිල බණ්ඩාර යන අයගේ ප්‍රකාශය :-**

2018.01.24 වන දින පාර්ශවයන් කැඳවා කොමිෂන් සභාව ඉදිරියේ පවත්වනු ලැබූ පරීක්ෂණයේදී වගඋත්තරකාර පොලිස් කොස්තාපල් 47894 ප්‍රකාශ කර ඇත්තේ, තමා 2017.06.07 වන දින නොච්චියාගම නගරයේ රථවාහන පාලන හා මාර්ග ආරක්ෂක රාජකාරියේ යොදවා තිබූ බවත් ,මෙදින පැය 18.00 ට නොච්චියාගම නගරයේ ඔරලෝසු කණුව අසල රාජකාරියේ යෙදී සිටින අවස්ථාවේදී තමා සිටි ස්ථානයේ සිට මීටර් 5ක් හෝ 10 ක් දුරින් පුද්ගලයෙකු පරුෂ වචන කියමින් සිටි බවත්, ඒ අනුව තමන් එම ස්ථානය වෙත ගිය බවත්ය. එසේ යන විට අදාළ පුද්ගලයා මහජනතාවට පෙනෙන පරිදි මුත්‍රා කරමින් සිටිනු දුටු බවත්, එම පුද්ගලයා අසලට ගොස් මෙලෙස හැසිරෙන්නේ මන්දැයි විමසා සිටි නමුත් ඔහු පරුෂ වචන කියමින් සිටි බවත්, එම අවස්ථාවේ මෙම තැනැත්තා බීමත්ව සිටි බවත්, මෙම පුද්ගලයා නගරයේ අශෝභන ලෙස හැසිරීම හේතුකොට ගෙන 2017.06.07 වන දින වරද කියාදී පැය 18.30ට බීමත්ව අශෝභන ලෙස හැසිරීම සම්බන්ධයෙන් වරද කියා දී අත්අඩංගුවට ගත් බවත් දක්වා ඇත.

පසුව ඔහුව උපසේවයට භාරදුන් බවත්, මෙම අයගේ බීමත්භාවය පරීක්ෂා කිරීම සඳහා නොච්චියාගම රෝහල වෙත යොමුකළ බවත් දක්වා ඇත. එසේම මෙම පැමිණිලිකරුව 2017.06.08 වන දිනම ඇපමත මුදාහැර ඇති අතර, මෙම පැමිණිලිකරුට එරෙහිව අංක 44807 යටතේ ගරු අධිකරණය වෙත කරුණු වාර්තා කර ඇති බවත්, ගරු අධිකරණයෙන් නඩුව විමසන අවස්ථාවේදී මෙම පැමිණිලිකරු වරද පිළිගෙන රුපියල් 1500.00 ක දඩයක් ද ගෙවා ඇති බවත් ය.

එමෙන්ම මෙම පැමිණිලිකරුට එරෙහිව නගරයේ අශෝභන ලෙස හැසිරීම සම්බන්ධයෙන් මීට පෙරද අංක 7404 යටතේ නඩුවක් ගොනු කර තිබූ බවත්, එම නඩුව විමසන අවස්ථාවේදී වරද පිළිගෙන රුපියල් 12,500.00 ක දඩ මුදලක් ද ගෙවා ඇති බවය.

වගඋත්තරකරු ප්‍රකාශ කර ඇත්තේ, මෙම පැමිණිලිකරුව අත්අඩංගුවට ගැනීමෙන් පසු ඔහුට කිසිදු පහරදීමක් කර නොමැති බවත්,පහරදීමේ චෝදනාව ප්‍රතික්ෂේප කරන බවත් දක්වා ඇත.

**නිරීක්ෂණ හා නිගමනය :-**

පැමිණිලිකරු තම පැමිණිල්ල මගින් ප්‍රකාශ කර ඇත්තේ, වගඋත්තරකරු තමාව අත්අඩංගුවට ගෙන තමාගේ කණට පහරදී තුවාල සිදු කර තම අයිතිවාසිකම් උල්ලංඝනය කළ බවය. මේ සම්බන්ධයෙන් වගඋත්තරකරු සඳහන් කර ඇත්තේ, මෙම පැමිණිලිකරු නගරයේ බීමත්ව අශෝභන ලෙස හැසිරීමේ වරදට වරද කියා දී අත්අඩංගුවට ගෙන ගරු අධිකරණය වෙත ඉදිරිපත් කළ බවත්, පැමිණිලිකරුට කිසිදු පහරදීමක් සිදු කර නොමැති බවත්ය.

මෙම පැමිණිල්ලට අදාළව 2018.01.24 වන දින සිදුකරන ලද පරීක්ෂණයේදී කරුණු ඉදිරිපත් කරමින් වගඋත්තරකාර පොලිස් කොස්තාපල් 47894 අමිල බණ්ඩාර නිලධාරී දන්වා ඇත්තේ, මෙම පැමිණිලිකරු 2017.06.07 වන දින බීමත්ව නගරයේ අශෝභන ලෙස හැසිරෙමින් සිටියදී වරද කියා දී පැය 18.30 ට අත්අඩංගුවට ගෙන ඇති බවත්, එසේ රාජකාරී කරමින් සිටියදී මෙම පැමිණිලිකරු අත්අඩංගුවට ගෙන ඇති බවත් නිරීක්ෂණය වේ.

දෙපාර්ශවය විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති ලේඛන ප්‍රකාශ සලකා බැලීමේදී නොච්චියාගම නගරයේ ප්‍රසිද්ධ ස්ථානයක බීමත්ව අශෝභන ලෙස හැසිරීම යන වරද යටතේ පැමිණිලිකරුව අත්අඩංගුවට ගෙන ඇති අතර, ගරු අධිකරණයේ දී අදාළ වරද පිළිගෙන දඩ මුදල්ද ගෙවා තිබීම හේතුවෙන් පැමිණිලිකරුගේ අත්අඩංගුවට ගැනීම නීතිවිරෝධී අත්අඩංගුවට ගැනීමක් වන බවට කරුණු සනාථ නොවන හෙයින් වගඋත්තරකරුගේ ක්‍රියාවක් හේතුවෙන් පැමිණිලිකරුගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 13(1) හි සඳහන් නීතියෙන් නියම කරණු ලැබූ පාර්ය පටිපාටියට අනුකූලව මිස කිසිම තැනැත්තෙකු සිරභාරයට ගැනීම නොකළ යුත්තේය යන අයිතිවාසිකම් පැමිණිලිකරු සම්බන්ධයෙන් උල්ලංඝනය වී නොමැති බව නිරීක්ෂණය වේ.

පැමිණිලිකරුව අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී වගඋත්තරකරු පැමිණිලිකරුගේ වම් කණට පහර දුන් බවටත්, අනතුරුව ද වගඋත්තරකරු පැමිණිලිකරුට පරුෂ වචනයෙන් බැන වැදී පහරදෙන්නට සූදානම් වූ බවටත් පැමිණිල්ල මගින් ප්‍රකාශ කර ඇත.

පැමිණිලිකරුව 2017.06.06 දින අත්අඩංගුවට ගෙන 2017.06.08 දින ඇප ලබා දීමෙන් පසු පැමිණිලිකරුට කණේ ඇති වූ ආබාධයන් හේතුවෙන් ප්‍රතිකාර ලබා ගැනීම සඳහා නොච්චියාගම රෝහලට ඇතුළත් වූ බවත්, වැඩිදුර ප්‍රතිකාර සඳහා අනුරාධපුර ශික්ෂණ රෝහල වෙතට යොමු වූ බවත් පැමිණිල්ල මගින් දන්වා ඇත.

ඒ අනුව පැමිණිලිකරුට අදාළ අධිකරණ වෛද්‍ය වාර්තාව අනුරාධපුර ශික්ෂණ රෝහල වෙතින් කැඳවා ඇති අතර ,අධිකරණ වෛද්‍යවරයාගේ වෛද්‍ය මතය පරිදි සටහන් කර ඇත. Left tympanic membrane perforation about 40% "Associated with mild to moderate conductive hearing case'

පැමිණිලිකරුව 2017.06.07 දින අත්අඩංගුවට ගෙන 2017.06.08 වන දින පැය 07.45 ට ඇප ලැබීමෙන් පසුව වෛද්‍ය ප්‍රතිකාර ගැනීම සඳහා පැමිණිලිකරු එදිනම රෝහල්ගතව ඇති බව අධිකරණ වෛද්‍ය වාර්තාව අනුව නිරීක්ෂණය වේ.

පැමිණිලිකරුව අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී ඔහුට පහරදීමක් සිදු වූ බව සනාථ කර ගැනීම සඳහා බාහිර සාක්ෂි ලබා දෙන ලෙස පැමිණිලිකරුට ලිඛිතව දන්වා ඇති අතර ,පැමිණිලිකරු බාහිර සාක්ෂි කිසිවක් කොමිසම වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර නැත.

නමුත් පැමිණිලිකරු විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද පැමිණිල්ල හා අධිකරණ වෛද්‍යවරයා විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති අධිකරණ වෛද්‍ය වාර්තාවේ සඳහන් සියලු කරුණු සලකා බැලීමේ දී පැමිණිලිකරුගේ පැමිණිල්ල හා අධිකරණ වාර්තාවේ සඳහන් තුවාල සැසඳෙන බැවින්ද, පැමිණිලිකරු සාධාරණ කාලයක් තුළදී වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීම සඳහා රෝහල්ගතව ඇති හෙයින් ද ,වගඋත්තරකරුගේ ක්‍රියාවක් හේතුවෙන් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 11 වන ව්‍යවස්ථාවෙහි සඳහන් 'කිසිම තැනැත්තෙකු වධහිංසාවලට හෝ කෲර අමානුෂික හෝ අවමන් සහගත සැළකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුත්තේය' යන අයිතිවාසිකම පැමිණිලිකරු සම්බන්ධයෙන් උල්ලංඝනය වී ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

> ඒ අනුව, 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 11 වන ව්‍යවස්ථාවෙහි සඳහන් 'කිසිම තැනැත්තෙකු වධහිංසාවලට හෝ කෲර අමානුෂික හෝ අවමන් සහගත සැළකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුත්තේය' යන පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම උල්ලංඝනය වී ඇති බැවින්, වගඋත්තරකාර පොලිස් කොස්තාපල් 47894 එස්.ඩී. අමිල බණ්ඩාර දිසානායක යන අය සම්බන්ධයෙන් විනය පියවර ගැනීම සඳහා මෙහි පිටපතක් පොලිස්පතිවරයා වෙත, ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත හා නීතිපතිවරයා වෙත යොමුකරනු ලැබේ.

2023. 01. 23 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

A. Shanmuganathan

අනුසූයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

මා.හේ. නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත :-

01. පොලිස්පතිතුමා,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

02. නීතිපතිතුමා,
නීතිපති දෙපාර්තමේන්තුව,
අලුත්කඩේ, කොළඹ 12.

03. මා.හි.කො.ස ප්‍රාදේශීය කාර්යාලය,
අනුරාධපුර.

B/